**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය - 2017**

**-------------------------------------------------------------**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ 38 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

ප්‍රමිතයෙහි 32 වගන්තිය ප්‍රකාරව, ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිළව් නොකල යුතුය. එහෙත් රොබෝ තාක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා අමාත්‍යාංශය මගින් 2016 හා 2017 වර්ෂවලදී ලබා දී තිබූ රු.60,000,000 ක ප්‍රදාන හා එම මුදල් වැය කර මිලදීගෙන තිබූ රු.57,195,219 ක වත්කම් එකිනෙකට හිළව්කර රු.2,804,781 ක ශුද්ධ ශේෂය පමණක් ජංගම නොවන වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන ප්‍රදාන රු.57,195,219කින් අඩුවෙන් දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08**

ප්‍රමිත 42 ඡේදය ප්‍රකාරව, අස්තිත්වයක් විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි වරද සිදුවූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවත් එපරිදි කටයුතු කිරීමකින් තොරව ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ශේෂයන්ට ගැලපීම් කර 2016 වර්ෂයේ සංසන්දනාත්මක අගයන් ඉදිරිපත්කර තිබුණි. තවද, ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව, පෙර කාලපරිච්ඡේද වැරදි සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

(i) ප්‍රමිතයෙහි 36 වගන්තිය පරිදි ස්ථාවර වත්කම් අයිතමයන් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම් පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කල යුතු වුවද, ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමේදී පිළිවෙලින් රු.39,163,047 ක හා රු.155,469,122 ක වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ii) යන්ත්‍ර උපකරණ, මුද්‍රණ යන්ත්‍ර, කාර්යාල උපකරණ බයිසිකල් හා පරිගණක ප්‍රත්‍යාගණන වටිනාකම රු.65,735,659 ක් ගිණුම්ගත කර තිබුණද, පිරිවැය මත ක්ෂය ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය රු.881,401 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18**

ඉල්ලුම්කල නිෂ්පාදනයන් සිදුකර භාරදී නොතිබියදී ප්‍රමිතයෙහි 14 වගන්තියට පටහැනි ලෙස ඉන්වොයිස් වටිනාකම රු.3,902,217 ක් වූ නිෂ්පාදනයන් සමාලෝචිත වර්ෂයේ විකුණුම් ලෙසද ඊට අදාළ පිරිවැය රු.2,225,726 ක් විකුණුම් පිරිවැය ලෙසද ගිණුම්ගතකර තිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20**

රජයේ ප්‍රදාන වශයෙන් වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.1,964,238,178 ක්වූ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය ප්‍රමිතයේ 12 ඡේදය ප්‍රකාරව, ක්‍රමානුකූල පදනමක් මත ලියාහැරීම සඳහා කටයුතු කර නොතිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39**

ප්‍රමිතයෙහි 46(අ) වගන්තිය ප්‍රකාරව, වෙළඳ පොලී අනුපාතයට අඩුවෙන් දෙන ලද සේවක ණය, සඵල පොලී අනුපාත ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගත යුතු අතර වෙළඳ පොලී අනුපාතය හා ණය සඳහා ලැබෙන පොලී අනුපාතය අතර වෙනස සේවක පිරිවැය ලෙස හඳුනාගෙන නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී විශේෂ ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබූ රු.30,600,174 ක පුනරාවර්තන ප්‍රදාන සහ එම ව්‍යාපෘති සඳහා දරන ලද රු.36,365,951 ක වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ගැලපීම් කිරීමකින් තොරව ප්‍රදාන ගිණුමක් හරහා ගැලපීම් කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත්තු සඳහා ගෙවීම් කිරීමේදී සමාලෝචිත වර්ෂයේදී අඩුකරන ලද රඳවාගත් මුදල් රු.3,062,748 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) බුත්තල කාර්මික ජනපදයේ අභ්‍යන්තර මාර්ග, කානු පද්ධතිය සකස් කිරීම හා වැට ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවලට අදාලව සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද එකතු කල අගය මත බදු රු.1,644,239 ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඈ) අනුරාධපුර නැගම්පහ කාර්මික ජනපදයේ ඉඩම සුද්ද කිරීම හා වැට ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවට අදාළව ගෙවියයුතු වියදම් රු.993,089 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාලව ක්ෂයවීම් ලෙස වැරදීමකින් ප්‍රත්‍යාගණන සංචිතයට හර කර තිබූ රු.11,051,161 ක් සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි.

(ඊ) වර්ෂ ගණනාවක සිට ප්‍රදාන ලෙස ලැබී තිබූ තොග අයිතමවල වටිනාකම ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්මික ජනපද අංශයේ වාර්තා අනුව කාර්මික ජනපද 13 කින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු ශේෂය රු. 15,277,733 ක් වුවද ගිණුම් අංශයේ වාර්තා අනුව එය රු.36,150,400 ක් වූයෙන් රු. 20,872,667 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට තොග වටිනාකම රු.9,494,613 ක් වුවද, භෞතික සත්‍යාපන වාර්තා අනුව තොග ශේෂය රු.8,594,832 ක් වූයෙන් රු.899,781 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු එකතු කල අගය මත බදු රු.51,363,240 ක් වුවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබන එකතු කල අගය මත බදු වාර්තා අනුව එම වටිනාකම රු.29,408,699 ක් වූයෙන් රු. 21,954,541 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙනත් ලැබිය යුතු වත්කම් ලෙස 2013 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල සිට පැවත එන ශේෂ 04 ක එකතුව රු.1,304,303 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්මික ජනපදවලින් හා ණය ගැතියන්ගෙන් ලැබිය යුතු රු.45,448,707 ක ශේෂයෙන් වර්ෂ 05 ක් ඉක්මවූ ශේෂය රු.24,037,750 ක් වූ අතර මුළු ලැබිය යුතු වටිනාකමින් සියයට 66 ක් එනම් රු.30,096,011 ක් කාර්මික ජනපදවලින් අයවිය යුතු කුලී වටිනාකමින් සමන්විත වී තිබුණි.

(ඇ) වර්ෂ පහකට පෙර සිට පැවත එන සේවක අත්තිකාරම් රු. 928,370 ක් නිරවුල් කර නොතිබුණි.

(ඈ) අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව ගෙවා තිබූ රු.5,402,511 ක අත්තිකාරම් මුදලක් නිරවුල් කර නොතිබුණි.

(ඉ) කාර්මික ජනපද කර්මාන්තකරුවන් වෙත වර්ෂ 05 කට පෙර සිට ගෙවිය යුතුව පැවති රු. 3,072,949 ක ණයහිමි ශේෂය අදාල කර්මාන්තකරුවන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2016 වර්ෂය හා ඊට පෙර වර්ෂවලට අයත් රු.2,761,479 ක හා සමාලෝචිත වර්ෂයට අදාල රු.3,303,517 ක ජාතිය ගොඩනැගීමේ බදු මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(උ) 2016 වර්ෂයේ සිට ව්‍යාපෘති වියදම් වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශයෙන් අයවිය යුතු රු.3,731,167 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ 2012 හා 2014 වර්ෂවලදී අගරු වී තිබූ රු.209,398 ක චෙක්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 189 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය
------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.18,128,796 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.30,029,583 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.11,900,787 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම් රු.50,973,200 කින් වැඩි වී තිබුණද, දළ ලාභය රු.64,515,423 කින් ඉහළ යාම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.84,728,727 ක් වූ ඌනතාවය 2015 වර්ෂයේ දී රු.27,259,111 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණද, නැවතත් 2016 හා 2017 වර්ෂවලදී පිළිවෙලින් රු.30,029,583ක හා රු.18,128,796 ක ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු. 68,532,050 ක් ව පැවති දායකත්වය 2017 වර්ෂයේදී රු.213,500,294 ක් දක්වා වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

4.1 කාර්ය සාධනය
------------------

4.1.1 සැලසුම් කිරීම
----------------

2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර තිබුණ ද 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව එය පිළියෙල කර නොතිබුණි.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය
-------------------------------------

(අ) මණ්ඩලය විසින් ප්‍රධාන කාර්ය සාධක දර්ශක 05ක් (KPI) හඳුනාගෙන ඊට අදාලව ක්‍රියාකාරකම් සැලසුම් කර තිබුණද අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වී නොතිබූ බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය තුළ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් 400 ක ගේ ආදායම වර්ධනය කිරීම හා රැකියා අවස්ථා 2000ක් උත්පාදනය කිරීමට අපේක්ෂා කර තිබුණද, කර්මාන්තකරුවන් 187 ක ගේ පමණක් මුළු ආදායම වර්ධනය වී තිබූ අතර, රැකියා අවස්ථා 675 ක් පමණක් උත්පාදනය වී තිබුණි.

(ii) ජනපදවල කඩකාමර හෝ ඉඩම් බදු දීම මගින් නව ව්‍යාපාරික ස්ථාන 125ක් ඇති කර ඉන් රැකියා 500 ක් උත්පාදනය කිරීමට අපේක්ෂා කර තිබුණද, ව්‍යාපාර ස්ථාන 29 ක් ආරම්භ කර රැකියා අවස්ථා 444 ක් පමණක් උත්පාදනය කර තිබුණි. සැලසුම්කල ව්‍යාපාරික ස්ථාන සියල්ලම ආරම්භ කරනු ලැබුවේ නම් විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් උත්පාදනය කර ගැනීමේ හැකියාව පවතින බව නිරීක්ෂණය විය.

(iii) සමාලෝචිත වර්ෂය තුළ සේවා නියුත්තිකයන් 600 ක් පුහුණු කිරීමට සැලැසුම් කර තිබූ නමුත් සේවා නියුක්තිකයන් 198 දෙනෙකුට පමණක් පුහුණුවීම් ලබාදී තිබුණි.

(iv) විදේශ වෙළඳපොල හඳුන්වා දීමේ කාර්ය සාධන දර්ශකය යටතේ කර්මාන්ත 100ක නිෂ්පාදන 25ක් අපනයනය කිරීමට අපේක්ෂා කළද, කර්මාන්ත 15ක නිෂ්පාදන 12කට පමණක් විදේශ වෙළඳපොල හඳුන්වා දී තිබුණි.

(ආ) රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයේ 2017 වර්ෂය සඳහා සැලසුම්කල ක්‍රියාකාරකම් 11 ක් අතරින් ක්‍රියාකාරකම් 08 ක අපේක්ෂිත ඉලක්ක ළඟා කරගෙන නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බද්දේගම කාර්මික ජනපදය පිහිටුවා ඇති ඉඩම සඳහා පිඹුරුපත් සැකසීම හා මැනුම් කටයුතු සඳහා රු.15,576 ක් හා ඉඩම අත්පත් කර ගැනීම සඳහා අත්තිකාරම් ලෙස රු.500,000 ක් 2007 වර්ෂයේ ගෙවා ඇතත් විගණන දිනය වූ 2018 ජූලි 31 දින දක්වාම එම ඉඩම පවරාගෙන නොතිබුණි**.**

(ආ) සමාලෝචිත වර්ෂයේදී "foundry plant" නමැති උපකරණය මිලදී ගැනීම සඳහා රු.මිලියන 16 ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබී තිබූ නමුත් එම උපකරණය ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීම පමණක් 2018 සැප්තැම්බර් 12 දින වනවිට සිදුකර තිබුණි.

(ඇ) 2017 වර්ෂය තුළ පැවැත්වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 5 තුළදීම අය නොවන ණයගැති ශේෂ, සේවක අත්තිකාරම් අය කරගැනීම හා පොත්පත් යාවත්කාලීන කිරීම පිළිබඳ තීරණ ගෙන ඇතත් එම ගැටළු නිරාකරනය වී නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයේ රබර් නිෂ්පාදන කටයුතු සඳහා සෘජුව අවශ්‍යවන යන්ත්‍ර 64 කින් යන්ත්‍ර 26 ක් වසර ගණනාවක සිට ක්‍රියාවිරහිත වී තිබුණි. තවද තත්ත්ව පාලන විද්‍යාගාරය (QC Lab) සතුව භාවිතයට ගත නොහැකි තත්ත්වයේ අක්‍රිය උපකරණ 20ක් තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී රු.9,318,026 කට මිලදී ගනු ලැබූ රබර් ඉන්ජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රය මගින් රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තවල නියැලෙන ප්‍රතිලාභීන් 250 කට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම තුළින් කර්මාන්තකරුවන්ට තම නිෂ්පාදනවලට අවශ්‍ය සාම්පල් සකස් කර දීම අරමුණ වී තිබුණි. එසේ වුවද, 2016 සහ 2017 වර්ෂවලදී අභ්‍යාසලාභීන් 17 දෙනෙකු පමණක් පුහුණු කර තිබීම හා එක් ආයතනයකින් පමණක් ඇණවුමක් ලබාගෙන එයද පරීක්ෂණ මට්ටමේ පැවතීම හේතුවෙන් ඉහත අරමුණු කරා ළඟා වීම දුර්වල මට්ටමක පැවතුණි.

(ඇ) ගම්මාන සංවර්ධන වැඩ සටහන යටතේ ව්‍යවසායකයින් සඳහා බෙදා දීමට 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මිලදී ගෙන තිබූ වටිනාකම රු.4,130,850 ක් වූ තොග 2018 සැප්තැම්බර් 18 දින වන විටත් බෙදා හැර නොතිබුණි.

## 4.4 කාර්යමණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ අනුමත කාර්යමණ්ඩලයේ තනතුරු 728 ක් අතුරින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවති තනතුරු සංඛ්‍යාව 249 ක් වූ අතර ඒ තුළ ඇතුලත් ඉහළ කළමනාකරණ මට්ටමේ අනුමත තනතුරු 12 න් තනතුරු 05ක්ම පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. තවද, 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුලදී අනුමත තනතුරු 08 ක් වෙනුවෙන් නිලධාරීන් 69 දෙනෙකු කොන්ත්‍රාත් හා දෛනික දීමනා පදනම මත බඳවා ගෙන මාසිකව රු.2,236,324 ක් ගෙවා තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය තුල අන්තර්ගත නොවූ උපදේශක තනතුරු 04 ක් සඳහා 2015 හා 2016 වර්ෂවලදී නිලධාරීන් බඳවා ගෙන 2017 දෙසැම්බර් 31 දින දක්වා රු.4,152,023ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

----------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාලව මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තා හා ගිණුම් මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මාස 03 ක ප්‍රමාද කාලයකින් පසුව 2018 මැයි 21 දින ඉදිරිපත්කර තිබුණි.

### 6.2 ප්‍රසම්පාදනයන්

-------------------

2016/2017 කාලපරිච්ඡේදය වෙනුවෙන් ආරක්ෂක සේවා ලබාගැනීම සඳහා 2016 මාර්තු 15 දින සිදුකර තිබූ ලංසු කැඳවීමට අනුව ලංසු ඇගයීම් කමිටුව විසින් අවම මිල සහිත ලංසු 3 ක් නිර්දේශ කර තිබියදී කිසිදු හේතු දැක්වීමකින් තොරව ප්‍රසම්පාදන කමිටුව විසින් එම මිල ගණන් ප්‍රතික්ෂේප කර, 2016 අගෝස්තු 18 දින නැවත ලංසු කැඳවා තිබුණි. ඒ අනුව දෙවැනි වර ලැබී තිබුණු ලංසු ඇගයීම් කිරීමේදී සුළු බැහැරවීම් ලෙස සැලකිය හැකි ගිණුම් වාර්තා ලබානොදීම වැනි හේතු දක්වා ලංසු 3 ක් සහ අදාල සියළු විස්තර ඉදිරිපත්කර තිබියදී ඒවා නොමැති සේ සලකා තවත් ලංසු 10 ක්ද ප්‍රතික්ෂේප කර, 19 වන මිල සහිත ලංසුව, ජයග්‍රාහී ලංසුකරු ලෙස ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබීම විගණනයේදී ගැටළුකාරී විය. තවද එම තෝරාගත් ලංසුකරු මාස 2 ක කාලයක් පමණක් සේවා සපයා තිබුණු අතර එම ගෙවූ මිල හා මුල් ලංසු කැඳවීමේ මිල ගණන් සමග සැසඳීමේදී මාස 2 ක් සඳහා රු.769,683 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

**6.3 අයවැය පාලනය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 වගන්තිය ප්‍රකාරව අනුමත අයවැය එළඹෙන වර්ෂයේ මාස 03කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු වුවද මණ්ඩලය විසින් 2016 හා 2017 වර්ෂය තුළ රජයේ දායකත්වය, ආයතනයේ ඉපැයීම් හා සමස්ත වියදම් ඇතුලත් කර වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබූ අතර භාණ්ඩාගාර ප්‍රදාන සඳහා වැය ඇස්තමේන්තුවක් පමණක් පිළියෙල කර තිබුණි.

**6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2015 හා 2016 වර්ෂයන් සඳහා වූ වාර්ෂික වාර්තා 2018 ජූලි වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**6.5 නොවිසඳී ඇති විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නවබිම ගබඩා පරිශ්‍රයේ (Yard) ගබඩා කර තිබූ කිලෝග්‍රෑම් 1,500 ක් වූ අබලි තොග භෞතිකව සත්‍යාපනය සිදු කර ඇතත් එම වටිනාකම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පානළුව කාර්මික ජනපදයට ඉඩම් අත්පත්කර ගැනීම සඳහා 2016 සැප්තැම්බර් මාසයේදී අමාත්‍යාංශයෙන් රු.මිලියන 25 ක් ලැබී තිබුණද, මෙම වාර්තාවේ දින වනවිටත් ඉඩම් පවරාගෙන නොතිබුණි.

(ඇ) දීර්ඝ කාලයක සිට භුක්ති විඳින ප්‍රධාන කාර්යාල ඉඩම ඇතුළුව දිස්ත්‍රික්ක 10 ක පවත්වාගෙන යන ප්‍රාදේශීය කාර්යාල හා වෙනත් මධ්‍යස්ථාන පවත්වාගෙන යන ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙම වත්කම්වල අගය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) මූල්‍ය පාලනය | (i) | බැංකු සැසඳුම් ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් නොකිරීම. |
| | (ii) | විවිධ අංශවල මූල්‍ය ගනුදෙනුවලට අදාල ලියකියවිලි ගිණුම් අංශය විසින් කාර්යක්ෂමව රැස් නොකිරීම. |
| (ආ) ණයගැති පාලනය | (i) | ශේෂ සනාථ ලබා නොගැනීම. |

| | | | |
|---|---|---|---|
| | | (ii) | ලේඛන යාවත්කාලීන නොකිරීම. |
| (ඇ) | තොග පාලනය | (i) | තොග ලේඛන යාවත්කාලීන නොකිරීම. |
| | | (ii) | හානි වූ තොග ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු නොකිරීම. |
| | | (iii) | ඇතැම් තොග අයිතම සම්බන්ධයෙන් ලෙජර්කාඩ් හා බින් කාඩ්පත් ශේෂ අතර අසමානතාවයන් පැවතීම. |
| | | (iv) | අලෙවි අංශය විසින් ක්‍රමානුකූලව පොත්පත් පවත්වා ගෙන නොතිබීම හා භාණ්ඩ නිකුත් කිරීමේදී පවත්නා තොග සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් කර නොතිබීම. |
| | | (v) | මිල අධික තොග නිසි පරිදි ගබඩා කර නොතිබීම හා ගබඩාව අවට ආරක්ෂක විධි විධාන යොදා නොතිබීම. |
| (ඇ) | ලේඛන පවත්වාගෙන යාම | | හානි පාඩු ලේඛනය යාවත්කාලීන නොකිරීම. |